# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1527 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 30/09/2024

පැය 1055

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.09.30 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

**02.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 75 | 540 | බැරල් 04<br>තඹ දගර 01<br>ගෑස් සිලින්ඩර් 01<br>ගෑස් ලිප් 01<br>රෙගියුලේටර් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. ගිනි අවියක් හා පතොරම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.09.29 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැලිවේරිය පොලිස් වසමේ කිරිකිත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර විදේශීය රටක නිෂ්පාදිත මයික්‍රෝ වර්ගයේ පිස්තෝල අවියක් සහ පතොරම් 06 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැලිවේරිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන වැලිවේරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වැලිවේරිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුර.**

2024.09.29 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංග්‍රාමික යතුරු පැදි කණ්ඩායමේ නිලධාරින් විසින් ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් ග්‍රෑම් 17 මිලි ග්‍රෑම් 600 , කොකේන් ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 05 ක් හා හදුනා නොගත් මත්පෙති ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 08 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 15 හා 33 වයස්වල පසුවන** මාලිගාවත්ත **හා දෙමටගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.** ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**